**රැකියාවේ නියැලෙන්න කදිම ස්ථානයක් බවට Airtel පත්වෙයි හොඳම සේවා ස්ථාන 25 අතරට**

තෘප්තිමත් ලෙසින් වෘත්තියක නියැලීමට අවශ්‍ය හිතකර පරිසරය ගොඩනැගීමේ කර්තව්‍යයෙහි කදිම නිදසුනක් බවට පත්වෙමින්, ස්වාධීන විශ්ලේෂකයකු වන Great Place to Work ආයතනය විසින් තෝරාගනු ලබන 'හොඳම සේවා ස්ථාන 25' අතරට තෙවැනි වරටත් ඇතුළත්වීමට Airtel Lanka සමාගම සමත් වී තිබේ. Airtel Lanka සමාගම තමන්ට හා තමන්ගේ සේවානියුක්තියන් වෙනුවෙන් විශ්වාසය මත පදනම්වූ, සබඳතා සවිබලගැන්වීමේ රීතියකට අනුව කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ Great Place to Work ආයතනය නිර්නාමික සේවා සමීක්ෂණයක්, පුද්ගල භාවිතයන්ගේ ඇගයීමක් සහ සංස්කෘතික විගණනයක් ගැඹුරින් සිදුකර උසස් සේවා ස්ථානයකට සපරිය යුතු අවශ්‍යතා පිළිබඳ විමසා බලයි.

Airtel Lanka සමාගමේ මානව සම්පත් අංශයේ ප්‍රධානී කනිෂ්ක රණවීර මහතා අදහස් දක්වමින් 'වෘත්තීය පරිසරය බලගැන්වීම හා සේවා පලපුරුද්ද සාරවත් කිරීම' යන Airtel Lanka සමාගමේ ප්‍රතිඥාව උසස් සේවා ස්ථානයකට අත්‍යවශ්‍ය ගුණාංගයන් සපුරාලනවා. Airtel Sri Lanka හි සේවා සංස්කෘතිය අපේ උරුමයක් වගේම 'සේවානියුක්තිකයන් මෙන්ම අපූර්ව සමාගමක්' යන හැඟීමද එයට බලපා තියෙනවා' යැයි පැවැසීය.

'ප්‍රාණවත්, සියල්ල සපිරි හා ගෞරවනීය' යන වටිනාකම් මත ගොඩනගමින් Airtel සංස්කෘතිය විවිධත්වයට ගරු කරමින් සැමට සමාන අවස්ථාවන් ප්‍රවර්ධනය කරයි. විවෘත කාර්යාල සංස්කෘතියක් ක්‍රියාත්මක වෙන Airtel හි ප්‍රධාන විධායක නිලධාරියා පවා සිය සේවා නියුක්තිකයන් සමඟ අසුන්ගෙන තම කටයුතු සිදුකරන අතර එයින් සහයෝගීතාවයේ සංස්කෘතිය ප්‍රවර්ධනය වෙයි. වෙනත් රටක පදනම්වූ ස්වාධීන 'දුක්ගන්නාරාල' කෙනෙකු ඇතුළුව විවෘත හා විනිවිද පෙනෙන පුද්ගල භාවිතයන් තුළින් සමාගම සමානාත්මතාවය තහවුරු කරයි.

ක්‍රියාකාරී ව්‍යාපෘති කණ්ඩායම් 22ක් හරහා ව්‍යාපාර උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා Airtel සමාගම අද්විතීය ප්‍රවේශයක් ගොඩනගා තිබේ. සියලුම සේවකයන්ට සාමූහික ඉලක්ක කරා යැමට හැකිවන හා වගකිවයුතුවීම සඳහා අංශ වශයෙන් බෙදුනු මානසිකත්වය තුරන් කිරීමට මෙය උපකාරී වේ.

'සැමට ප්‍රයෝජනවත් වන අයුරින් විදුලි සංදේශ සේවාවන්ට සමීපවීමට හැකිවන සේ නව්‍යකරණය හා තාක්ෂණය මෙයෙවන්නයි අපි උත්සාහ කරන්නෙ. එම සාර්ථකත්වයේ මට්ටමට ළඟාවීමට නම් නිරන්තරයෙන් හොඳ සේවා ස්ථානයක් පවත්වාගෙන යමින් අනාගත අවශ්‍යතාවන් සඳහා සූදානම්විය යුතු බව අපි හඳුනාගෙන තියෙනවා' යැයි Airtel Lanka සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී ජිනේෂ් හෙජ් මහතාගේ අදහස විය.

නම්‍යශීලී සේවා පැය ගණනක්, සැහැල්ලු ඇඳුම් සහ අදාළ නිවාඩු ඇතුළත්ව Airtel සිය සේවානියුක්තිකයන් වෙනුවෙන් නම්‍යශීලී වෘත්තීය පිළියෙල කිරීම් සපයයි. නෛතික අවශ්‍යතාවන්

අභිබවා කාන්තාවන්ට සති 26ක මාතෘ නිවාඩු සඳහා හිමිකම් ඇති අතර පීතෘත්ව නිවාඩු මෙන්ම ළදරු රැකවරණ නිවාඩුද මේ සංවේදී සමාගම විසින් පිරිනමනු ලැබේ.

එපමනක් නොව, කළමනාකරනයේ නියුතු කාන්තාවන් ප්‍රවර්ධන කරන Airtel නූතන වැඩකරන කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලයි. සමාගමේ නවතම මූලාරම්භය මඟින් ශ්‍රී ලංකා සේවායෝජකයන්ගේ සම්මේලනයේ සහයෝගයද ඇතිව විවිධ හැකියාවන් සහිත ආබාධිත පුද්ගලයන්ට පුහුණුවීමේ අවස්ථාවන් ලබාදෙයි.

තවදුරටත් අදහස් දක්වූ Airtel Lanka සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී ජිනේෂ් හෙජ් මහතා 'අපේ සේවානියුක්තිකයන් සැමවිටම සමාගමේ මූලික සාධකය බවට පත්ව සිටිනවා. අදාළ සෑම දෙයකින්ම සමන්විත වූ කර්මාන්තයක් ලෙස අපගේ සාර්ථකත්වය බවට නිරන්තරයෙන් පත්ව සිටින්නේ අපගේ සේවානියුක්තිකයන්. උසස් සේවා ස්ථානයක්, එසේ නැතිනම් අපි කවුරුන්ද යන්න ප්‍රත්‍යක්ෂ වන්නේ ඔවුන් නිසාවෙන්' යනුවෙන් සඳහන් කළේය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ මූලස්ථානගතවී ඇති Great Place to Work ආයතනය යනු ඉහළ විශ්වාසයක්, ඉහළ කාර්යසාධනයක් හා වෘත්තීය සංස්කෘති මත පදනම්වූ ගෝලීය විශේෂඥයෙකි. හිමිකාර තක්සේරු මෙවලම්, උපදේශන සේවා, සහතික කිරීමේ වැඩසටහන්, හොඳම සේවා ස්ථාන ලැයිස්තු සහ සේවා ස්ථාන සමාලෝචන මඟින් උසස් සේවා ස්ථාන ආයතනය මිණුම් සළකුණු, විශේෂිත වූ රාමු සහ කැපී පෙනෙන සේවා ස්ථාන සංස්කෘතීන් නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම සහ හඳුනාගැනීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම සපයයි. උසස් සේවා ස්ථාන ආයතනය මහද්වීප 5ක ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 57ක ව්‍යාපාර, ලාභ නොලබන සහ රාජ්‍ය ආයතන සඳහා විධායක උපදේශනය හා සංස්කෘතික උපදේශන ලබාදෙයි.

Bharati Airtel Lanka සමාගම යනු..

Bharati Airtel Lanka (Airtel) සමාගම 2009 වසරේ ජනවාරි මාසයේ 12 වැනිදා ශ්‍රී ලංකාවේ වානිජ මෙහෙයුම් සේවා දියත් කළ අතර වේගවත්ම මිලියනයක පාරිභෝගික ජාලය ගොඩනැඟීමේ ගෞරවයද Airtel ජාලය සතුය. වසර 3කටත් අඩු මෙහෙයුම් කාලයකින් රටපුරා තම ජාලය ව්‍යාප්ත කරමින් විවිධ ක්ෂේත්‍රයන්හි උපායමාර්ගික ශ්‍රේණිගතකිරීම්හි පෙරමුණ ගන්නටද ඔවුන් සමත් වූ අතර දිවයින පුරා ආවරණය තහවුරු කරමින් Airtel, ශ්‍රී ලංකාවේ වේගයෙන්ම ව්‍යාප්ත වන ජංගම දුරකථන ජාලය බවටද පත්විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී තිබෙන Airtel, හඬ ඇමතුම් හා දත්ත ඇතුළත් ඩිජිටල් ජංගම සේවා සපයයි. වැඩිදුර තොරතුරු සඳහා www.airtel.lk වෙබ් අඩවියට පිවිසෙන්න